# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2270/66 - 2022 මාර්තු මස 11 වැනි සිකුරාදා - 2022.03.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

**1949 අංක 58 දරන මුදල් නීති පනත**

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 68 වන වගන්තිය සමග කියවිය යුතු 10 (c) වගන්තිය යටතේ සකස්කළ රීතීන්.

**නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,**
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2022 මාර්තු මස 11 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

**අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම**

1. මෙම රීති "2022 අංක 1 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, 1949 අංක 58 දරන (සංශෝධිත) මුදල් නීති පනතෙහි 10 (c) වගන්තියෙහි විධිවිධාන සමග එක්ව කියවිය යුතු එම පනතේ 68 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කරමින්, අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම සහ එකී මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමට අදාළ රීතීන් මෙමගින් නිකුත් කරනු ලබයි.

1A - G 36335 — 30 (2022/03)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3. සෑම භාණ්ඩ සහ/හෝ සේවා අපනයනකරුවෙකුම;

(i) අපනයනය කරන ලද සියලු භාණ්ඩ සහ/හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට සපයන ලද සේවා වලට අදාළව අපනයන ඉපැයීම්, අදාළ පරිදි භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට හෝ සේවාවන් සැපයූ දිනයේ සිට,දින එකසිය අසූවක් (180) ඇතුළත අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකාව වෙත ගෙන්විය යුතුය.

(ii) භාණ්ඩ සහ/හෝ සේවා අපනයනය සම්බන්ධයෙන් වන සියලුම අපනයන ඉපැයීම් ලද විගස, සියලු අපනයන ඉපැයීම් ලැබීම්වලට අදාළ සියලු ලේඛනගත සාක්ෂි, එම මුදල් ලබන්නා වූ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ අවසරලත් බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට (මෙහි මින්මතු "බලපත්‍රලාභී බැංකුව" වශයෙන් හඳුන්වනු ලබන) නොපමාව ඉදිරිපත් කළ යුතුය.

4. ඉහත 3 රීතියට අනුව අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගන්නා සෑම භාණ්ඩ සහ/හෝ සේවා අපනයනකරුවෙකුම, මාසයක් තුළ, ශ්‍රී ලංකාවට ලැබෙන එම ආදායමෙන් පහත සඳහන් **අවසරලත් ගෙවීම්** සඳහා පමණක් භාවිතයෙන් අනතුරුව, ශේෂය එළඹෙන මාසයේ හත්වන (7) දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල්වලට අනිවාර්යයෙන්ම පරිවර්තනය කළ යුතුය.

(i) එක් මසක වගකීම් ද ඇතුළුව නිශ්චිත භාණ්ඩ සහ/හෝ සේවා අපනයනයකට අදාල ජංගම ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ;

(ii) භාණ්ඩ සහ/හෝ සේවා අපනයනයට අදාල සංචාරක අරමුණු සඳහා විදේශ මුදල් නෝට්ටු ආපසු ලබා ගැනීම හෝ මුදල් මාරුකිරීම;

(iii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත හෝ 1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද රෙගුලාසි, නියෝග සහ විධාන ප්‍රකාරව, එක් මසක ණය වගකීම් ද ඇතුළුව භාණ්ඩ සහ/හෝ සේවා අපනයනකරුවන් විදේශ ව්‍යවහාර මුදලින් ලබා ගන්නා ලද ණය මුදල්, ආපසු ගෙවීමේ වියදම් සහ ණය වාරික;

(iv) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ අවසර දී ඇති පරිදි අනේවාසික ආයෝජකයන්ට ප්‍රකාශිත ලාභාංශ ගෙවීම් සහ/හෝ විදේශීය ජාතිකයන් හෝ ද්විත්ව පුරවැසියන් වන ප්‍රවාසික සේවකයින්ට වැටුප් ගෙවීම් ;

(v) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සඳහා, එම ලබන්නා වූ අපනයන ආදායමෙන් ප්‍රතිශතාංක දහයක් (10%) දක්වා, සිදු කරන ගෙවීම් ;

(vi) නිශ්චිත භාණ්ඩ සහ/හෝ සේවා අපනයනයක් සම්බන්ධ මිල දී ගැනීමක් සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ අවසරලත් දේශීය සැපයුම්කරුවන්ට කරන ගෙවීම්.

5. ඉහත 4 රීතියෙහි සඳහන් එකී පරිවර්තන දිනය ඉහත 3(1) රීතියට අනුව, අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ලැබිය යුතු දිනට පසු දිනයක් නොවිය යුතුය (එනම්, භාණ්ඩ නැව්ගත කළ/සේවාව සැපයූ දිනයේ සිට දින එකසිය අසූවකට (180) පසු දිනයක් නොවිය යුතුය).

6. ඉහත 4(vi) රීතිය ප්‍රකාරව, අපනයන ඉපැයීමකින් විදේශ මුදලින් ගෙවීම් ලබන සෑම දේශීය සැපයුම්කරුවෙකුම, එසේ ලැබෙන ආදායමෙන්, ඉහත 4 රීතියෙහි (i) අයිතමයේ සිට (v) අයිතමය දක්වා සඳහන් කර ඇති අවසරලත් ගෙවීම් සඳහා පමණක් භාවිතයෙන් අනතුරුව, ශේෂය එළැඹෙන මාසයේ හත්වන (7) දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල් වලට අනිවාර්යයෙන්ම පරිවර්තනය කළ යුතු ය.

7. 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත (සංශෝධිත) යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ "ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති" ලෙස ලියාපදිංචි කරන ලද භාණ්ඩ සහ/හෝ සේවා අපනයනකරුවන් හට, අවස්ථානුකූලව, මුදල් මණ්ඩලය විසින් තම අභිමතය පරිදි මෙම රීති යටතේ වන යම් හෝ සියළුම අවශ්‍යතා වලින් නිදහස් කිරීම් ලබා දීම සිදු කළ හැකිය.

8. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම ඉහත 3 වන රීතියෙන් නියම කරන ලද කාලය තුළ අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ ඉහත 4 සහ 6 වන රීති වලින් නියම කර ඇති පරිදි එම මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්යයෙන්ම දැඩිව අධීක්ෂණය කළ යුතු අතර, ඒ සඳහා අදාළ වන හෝ ඒ හා බැඳෙන අවශ්‍ය සියලු ලිඛිත සාක්ෂි පවත්වාගෙන යා යුතුය.

9. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම කලින් කලට නියම කරනු ලබන පරිදි වාර්තා සහ/හෝ ප්‍රකාශන, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති හෝ නියෝජ්‍ය අධිපති විසින් බලය දෙනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් හට ඉහත 8 වන රීතිය යටතේ පවත්වාගෙන යනු ලබන වාර්තා පරීක්ෂා කිරීම සහ එකී බලපත්‍රලාභී බැංකු විසින් මෙම රීතීන් විෂයෙහි අනුකූලතාවය තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම සඳහා බාධාවකින් තොරවූ ප්‍රවේශයක් ලබා දිය යුතුය.

10. මෙම රීතීන්ට අනුව, භාණ්ඩ සහ/හෝ සේවා අපනයනයේ දී, ඕනෑම අපනයනකරුවෙකු/දේශීය සැපයුම්කරුවෙකු හෝ බලපත්‍රලාභී බැංකුවක් විසින් මෙකී රීතීන් සමග අනුකූල නොවීමට හෝ උල්ලංඝනය කිරීමට විරුද්ධව ක්‍රියාත්මක වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට අයිතිය ඇත.

11. මෙම රීතීන් බලාත්මක වන දින හෝ ඉන් පසුව අපනයනය කරන ලද සියලුම සහ සෑම භාණ්ඩයකට සහ/හෝ සේවාවකට සහ මෙම රීතිය බලාත්මක කිරීමට පෙර දිනක අපනයනය කරන ලද එහෙත් භාණ්ඩ නැව් ගත කළ හෝ සේවා සැපයූ දින සිට එකසිය අසූව (180) වැනි දිනය මෙම රීතිය ක්‍රියාත්මක වූ දිනට පසු ඕනෑම දිනයක් වන භාණ්ඩ සහ/හෝ සේවා සඳහා ද මෙම රීතිය අදාළ වේ.

12. සැක දුරුකර ගැනීම පිණිස හා මෙකී රීතිවල කාර්යය සඳහා "අපනයන ඉපැයීම්" යන්නට, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (සංශෝධිත) ප්‍රකාශයට පත් කරන ලද, 2021 අංක 4 දරන විදේශ විනිමය (විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග ප්‍රකාරව සහ ඒ යටතේ ශ්‍රී ලංකාවට නැවත ගෙන්වා ගැනීමට අවශ්‍ය වන අපනයන ඉපැයීම්වලින් ලද මුදල්, අපනයන බිල්පත් මිල දී ගැනීම් වලින් ලබන ආදායම (බිල්පත් වට්ටම් කිරීම), දේශීය සේවා සපයන්නන්/දේශීය නිෂ්පාදකයන් විසින් අපනයනය කරන ලද භාණ්ඩ සහ/හෝ සේවා වෙනුවෙන් දේශීය නියෝජිතයන්/අතරමැදිකරුවන් හරහා ලැබෙන ගෙවීම් සහ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකුට වෘත්තීමය, වෘත්තීය හෝ ව්‍යාපාරික සේවා ඇතුළුව සේවා සැපයීමෙන් ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකුට විදේශ විනිමයෙන් ලැබෙන ගෙවීම් ඇතුළත් වේ.

13. මෙකී රීතිවල කාර්යය සඳහා "බලපත්‍රලාභී වාණිජ බැංකු" සහ "බලපත්‍රලාභී විශේෂිත බැංකු" යන්නට, 1988 අංක 30 දරන (සංශෝධිත) බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව නියම කරන ලද අර්ථය අදාළ වේ.

14. මෙම රීතිවල කාර්යය සඳහා "ජංගම ගනුදෙනු" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ නියම දී ඇති අර්ථයම තිබිය යුතුය.

15. මෙම රීතිවල කාර්යය සඳහා "විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු ලබා ගැනීම හෝ සංචාරක අරමුණු වෙනුවෙන් මුදල් මාරු කිරීම" 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද විධානයන් ප්‍රකාරව විය යුතුය.

16. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද, 2021 ඔක්තෝම්බර් 28 දිනැති, අංක 2251/42 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* ප්‍රකාශයට පත් කරන ලද, 2021 අංක 5 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ රීති මෙමගින් අවලංගු කෙරේ.

EOG - 3 - 0843

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.